*සැ. යු.-* 2022.11.11 දින පළ කරන ලද අංක 2306 *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,307 - 2022 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2022.11.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1498 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 1498 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1499 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1500 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 දෙසැම්බර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 නොවැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1497 B 082401 — 403 (2022/11)

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2022 අංක 787

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරි ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා 2022 සැප්තැම්බර් මස 24 දින සිට ක්‍රියාත්මකවන පරිදි, කොන්ත්‍රාත් පදනම මත, වසර දෙකක (02) කාලසීමාවක් සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2022 නොවැම්බර් මස 15 වැනි දින දී ය.

11 - 507

---

## වෙනත් පත්කිරීම් ආදිය

2022 අංක 788

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික බලකාය**

නිලධාරීන්ගේ උසස් කිරීම්

*2021 ඔක්තෝබර් මස 20 වැනි දින සිට වෛද්‍ය ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් බාලසූරියගේ ධනුෂ්ක ගිම්හාන පෙරේරා, එන්ආර්එම් 3797, ශ්‍රීලංනාහ

*2022 මැයි මස 11 වැනි දින සිට ලුතිනන් (පනිසෞ) වශයෙන් :*

උප ලුතිනන් (පනිසෞ) හබක්වල වටවල කංකානමලාගේ අනුර උදය කුමාර, එන්ආර්ඩබ් 4215, ශ්‍රීලංනාහ

*2022 ජනවාරි මස 14 වැනි දින සිට වැඩ බලන ලුතිනන් වශයෙන් :*

උප ලුතිනන් වීරක්කොඩි ගිම්රිව් කුෂ්මාල් විජේගුනවර්ධන වික්‍රමතිලක, එන්ආර්එක්ස් 4131, ශ්‍රීලංනාහ

*2021 ජනවාරි මස 14 වැනි දින සිට උප ලුතිනන් (ඉ) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (ඉ) අමන්ද නිර්මාන් දෙඩන්ගොඩ, එන්ආර්ඊ 4140, ශ්‍රීලංනාහ
වැඩ බලන උප ලුතිනන් (ඉ) හපු අච්චිල්ලාගේ සංජය විරාජ් හපුආරච්චි, එන්ආර්ඊ 4144, ශ්‍රීලංනාහ

වැඩ බලන උප ලුතිනන් (ඉ) ප්‍රැන්ක් පීටර් ස්ටෙන්වෝල්, එන්ආර්ඊ 4149, ශ්‍රීලංනාහ
වැඩ බලන උප ලුතිනන් (ඉ) වැවලගේ ප්‍රනීත් නිර්මාල් ප්‍රනාන්දු, එන්ආර්ඊ 4152, ශ්‍රීලංනාහ

*2021 ජනවාරි මස 14 වැනි දින සිට උප ලුතිනන් (සිඉ) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (සිඉ) මන්ත්‍රී විතාන අවිෂ්ක ඩිමේෂ්, එන්ආර්සී 4141, ශ්‍රීලංනාහ

*2021 ජනවාරි මස 14 වැනි දින සිට උප ලුතිනන් (වි) වශයෙන් :*

වැඩ බලන උප ලුතිනන් (වි) කාරියවසම් බෝවිතන්ත්‍රී දේවින්ද දීසායු, එන්ආර්එල් 4142, ශ්‍රීලංනාහ
වැඩ බලන උප ලුතිනන් (වි) කෝදගොඩ ගමගේ ඉරුෂ දෙව්මිණ, එන්ආර්එල් 4145, ශ්‍රීලංනාහ
වැඩ බලන උප ලුතිනන් (වි) වරාහේන ලියනගේ රවිෂ්ක ඉෂාන් ප්‍රේමකුමාර, එන්ආර්එල් 4146, ශ්‍රීලංනාහ
වැඩ බලන උප ලුතිනන් (වි) උදයංග ධනුෂ්ක රන්දෙනිය, එන්ආර්එල් 4148, ශ්‍රීලංනාහ
වැඩ බලන උප ලුතිනන් (වි) කසුන් සුදර විජේවර්ධන, එන්ආර්එල් 4150, ශ්‍රීලංනාහ
වැඩ බලන උප ලුතිනන් (වි) කස්තුරි ආරච්චි විතානගේ පසන් සඳරෝචන කස්තුරිආරච්චි, එන්ආර්එල් 4151 ශ්‍රීලංනාහ

ඩීඑන්එස් උළුගේතැන්න, ආර්එස්පී*, වීඑස්වී, යූඑස්පී,
එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

11 - 347

---

# රජයේ නිවේදන

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/23/2019/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.11.11** වැනි දින සිට **2022.11.25** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව

එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.12.02** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ මිග/මීරි කොට්ඨාසයේ 04 වෙළුමේ 404 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 26/27 කල්එළිය, පල්ලෙවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කල්එළිය, පල්ලෙවෙල පිහිටි "පුපුලෙකන්ද වත්ත - කොටකන්ද වත්ත" නමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක තැ.මැ.මු.පි. 68 දරන පිඹුරේ කැබලි අංක 304 දරන ඉඩමට මායිම්,<br>*උතුරට* : ප්‍රවේශ මාර්ගය,<br>*නැගෙනහිරට* : ප්‍රවේශ මාර්ගය,,<br>*දකුණට* : කට්ටි අංක 308,<br>*බස්නාහිරට* : කට්ටි අංක 307.<br>බිම් ප්‍රමාණය : අ.00, රූ.00, පර්. 00, හෙක්. 0.460 | 01. ජනාධිපති ලේකම් විසින් 1986.12.30 දින ප්‍රදානය කරන ලද අංක ගම්/ප්‍ර 9401 දරන දීමනා පත්‍රය. |

11 - 327

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සෙලාන් බැංකුව පීඑල්සී - විජේරාම ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1350-12886524-001.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

සෙලාන් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022.09.22 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැන්ක් පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම ලියාපදිංචි අංක පීකිව්9) ප්‍රසිද්ධ නොතාරිස් දීපානි රංගේ විසින් සහතික කරන ලද 2018 අගෝස්තු 03 දිනැති උකස් බැඳුම්කර අංක 1810 මත අයවිය යුතු

මුදල් ගෙවීම, කළුතර ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව්එස්එස් 574 දරන ආර් ඇන්ඩ් එච් ෆැෂන්ස් යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කළුතර පදිංචි චලනි ප්‍රදීපා වල්පිට සහ කළුතර පදිංචි චලනී ප්‍රදීපා වල්පිට යනඅය බන්ධනදායී/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය මත සමාන කාල වාරික ණය පහසුකම සම්බන්ධයෙන් 2019 ජුනි 17 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අනූතුන්ලක්ෂ හැත්තෑඑක්දහස් දෙසිය විසිදෙකයි ශත හැත්තෑපහක (රු. 9,371,222.75) මුළු මුදලක් සහ රුපියල් අසූහත්ලක්ෂ හැටතුන්දහස් හයසිය එකොළහයි ශත හැටනවයක (රු. 8,763,611.69) මුදලක් මත 2019 ජුනි 18 දින සිට වසරකට සියයට දහඅට (18%) බැගින් පොළිය දැන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදලවන රුපියල් අනූතුන්ලක්ෂ හැත්තෑඑක්දහස් දෙසිය විසිදෙකයි ශත හැත්තෑපහක (රු. 9,371,222.75) 2019 ජුනි 18 දින සිට මුළු මුදල අයකර දිනය දක්වා පෙරකී පරිදි පොළිය සමග, ප්‍රසිද්ධ කිරීමේ වියදම්, එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී උකස් බැඳුම්කර අංක 1810 මගින් සෙලාන් බැන්ක් පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන, සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම කෝරළේ, අධිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ බණ්ඩාරගම් ප්‍රාදේශීය සභා ප්‍රාදේශීය බල සීමාව තුළ සහ 656ජී - රයිගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රයිගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ආර්. පෙරේරා විසින් සාදන ලද 2000.03.12 සහ 2000.06.04 දිනැති අංක 1408 සැලැස්මේ නිරූපණය වන "අමරිගේවත්ත *හෙවත්* මාරවත්ත" නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : වෙරලුගහමඩිත්තේඹිවිට ද, නැගෙනහිරට : මෙහි සඳහන් ලොට් 2 සහ 4 ද, දකුණට : මෙහි සඳහන් ලොට් 4 සහ බස්නාහිරට : දෙල්ගහවත්තේ ලොට් 7හි ඉතිරි කොටස ද, යන මායිම් තුළ එකී අංක 1408 සැලැස්ම අනුව පර්චස් දොළහක් (අ.0, රූ.0, පර්.12)ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම කෝරළේ, අධිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ බණ්ඩාරගම් ප්‍රාදේශීය සභා ප්‍රාදේශීය බල සීමාව තුළ සහ 656ජී - රයිගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රයිගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ආර්. පෙරේරා විසින් සාදන ලද 2000.03.12 දිනැති අංක 1408 සැලැස්මේ නිරූපණය වන "අමරිගේවත්ත *හෙවත්* මාරවත්ත" නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : වෙරලුගහමඩිත්තේඹිවිට ද, නැගෙනහිරට : වරාවත්තේකට්ටිය ද, දකුණට : අංක 1408 සැලැස්මේ ලොට් 3 සහ 4 (අඩි 12ක් පළල පාර සඳහා වෙන්කිරීම) සහ බස්නාහිරට : අංක 1408 සැලැස්මේ ලොට් 1 ද යන මායිම් තුළ එකී අංක 1408 සැලැස්ම අනුව පර්චස් දාහතරක් (අ.0, රූ.0, පර්.14.0)ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

3. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම කෝරළේ, අධිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ බණ්ඩාරගම් ප්‍රාදේශීය සභා ප්‍රාදේශීය බල සීමාව තුළ සහ 656ජී - රයිගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රයිගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ආර්. පෙරේරා විසින් සාදන ලද 2000.03.12 දිනැති අංක 1408 සැලැස්මේ නිරූපණය වන "අමරිගේවත්ත *හෙවත්* මාරවත්ත" නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1408 සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට : වරාවත්තේකට්ටිය ද, දකුණට: අංක 349 සැලැස්මේ සඳහන් අමරීගේවත්ත *හෙවත්* වරවත්ත ලොට් සී1 හි ඉතිරි කොටස සහ බස්නාහිරට : අංක 349 සැලැස්මේ සඳහන් ඇමරීගේවත්ත *හෙවත්* වරාවත්තෙහි ලොට් සී2 ද, යන මායිම් තුළ එකී අංක 1408 සැලැස්ම අනුව පර්චස් දහයක් (අ.0, රූ.0, පර්.10.0)ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පහත සඳහන් ඉඩම්වල උඩින් තුළ සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අදාළ අයිතීන් සමග.

1. පෙර කී රයිගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ආර්. පෙරේරා විසින් සාදන ලද 2000.03.12 දිනැති අංක 1408 සැලැස්මේ නිරූපණය වන ඇමරිගේවත්ත *හෙවත්* මාරවත්ත නමැති ඉඩමේ ලොට් 4 (අඩි 12ක් පළල පාර සඳහා වෙන්කිරීම) ලකුණු කළ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 5, අංක 1408 සැලැස්මේ සඳහන් ලොට් 1 සහ 2 ද, නැගෙනහිරට: අංක 1408 සැලැස්මේ සඳහන් ලොට් 3 ද, දකුණට : අංක 349 සැලැස්මේ සඳහන් අමරිගේවත්ත *හෙවත්* වරාවත්තෙහි ලොට් සී2 සහ බස්නාහිරට : ප්‍රධාන පාර ද, යන මායිම් තුළ එකී අංක 1408 සැලැස්ම අනුව පර්චස් හතරක් (අ.0, රූ.0, පර්.4.0)ක් විශාල ඉඩම.

2. පෙර කී රයිගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ආර්. පෙරේරා විසින් සාදන ලද 2000.03.12 දිනැති අංක 1408 සැලැස්මේ නිරූපණය වන ඇමරිගේවත්ත *හෙවත්* මාරවත්ත නමැති ඉඩමේ ලොට් 5 (මායිම් තාප්පයේ කොටස සමග ඉඩම් තීරුව) ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : දෙල්ගහවත්තෙහි ලොට් 7හි ඉතිරි කොටස ද, නැගෙනහිරට :

ලොට් 1 සහ අංක 1408 සැලැස්මේ සඳහන් ලොට් 4 ද, දකුණට: අංක 1408 සැලැස්මේ සඳහන් ලොට් 4 සහ බස්නාහිරට : ප්‍රධාන පාර ද, යන මායිම් තුළ එකී අංක 1408 සැලැස්ම අනුව පර්චස් දශම දෙකක් (පර්.0.2) ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

වී. ඒ. පරණගම (මිය),
නීතිඥ,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 305

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022.09.28 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

"නිමල් කන්ස්ට්‍රක්ෂන්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් වශයෙන් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන ගාල්ලගේ නිමල් නයනානන්ද,

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කුළසේකර අබයරත්න අදිකාරම් මුදියන්සේ රාලහාමිලාගේ නේත්‍රරානී කුළසේකර සහතික කරන ලද අංක 1212 සහ 2018 සැප්තැම්බර් මස 03 දින දරන උකස් බැඳුම්කරය මගින්, බන්ධනදායී/උකස්කරු වශයෙන් ගාල්ලගේ නිමල් නයනානන්ද විසින් මෙහි පහත උපලේඛනවල සවිස්තරව දැක්වෙන අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, එකී ගාල්ලගේ නිමල් නයනානන්ද විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද;

එකී බැඳුම්කර මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් ගෙවා පියවා දැමීම ඉහත කී ගාල්ලගේ නිමල් නයනානන්ද විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද;

ඒ අනුව, රුපියල් එක්කෝටි විසිහත්ලක්ෂ හතළිස්දෙදහස් එකසියදහයකුත් ශත විසිහයක (රු. 12,742,110.26) මුදලක් සහ තව ද, කාලීන ණය පහසුකම් මත 2022.06.20 වැනි දිනට මුල් හිඟ මුදල වන රුපියල් එක්කෝටි විසිතුන්ලක්ෂ තිස්එක්දහස් හයසියහතළිස්එකකුත් ශත දහසයක (රු. 12,331,641.16) මුදල මත එකඟ වූ පරිදි 2022.06.21 වැනි දින සිට තවදුරටත් පොළිය ද, තව ද, ඒ හා සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයක් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, අළුත්කඩේ වීදියේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### පළමුවන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර, මාතර ප්‍රාදේශීය සභා සීමාව තුළ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැවඉහළගොඩ ග්‍රාම නිලධාරි වසමේ, වැවඉහළගොඩ පිහිටි බෝගහහේන *හෙවත්* බෝගහහේනේවත්ත නමැති ඉඩමේ ඒකාබද්ධ කළ ලොට් A සහ B දරන ඉඩම් කැබලිවලට බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 23715 සහ 2015.10.26 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 8 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : ලොට් 22 ද, දකුණට : ලොට් 11 ද, බස්නාහිරට : ලොට් 30 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 23715 දරන පිඹුර අනුව පර්චස් දොළහක් (අ.0, රූ.0, පර්.12) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 830/01 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 23715 සහ 2015.10.26 දරන පිඹුරේ නිරූපිත ලොට් 29, 30 සහ 24 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබලි මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ අනෙකුත් පරවශතා අයිතිවාසිකම් ද සමග ය.

#### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර, මාතර ප්‍රාදේශීය සභා සීමාව තුළ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැවඉහළගොඩ ග්‍රාම නිලධාරි වසමේ, වැවඉහළගොඩ පිහිටි බෝගහහේන *හෙවත්* බෝගහහේනේවත්ත නමැති ඉඩමේ ඒකාබද්ධ කළ ලොට් A සහ B දරන ඉඩම් කැබලිවලට බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 23715 සහ 2015.10.26 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 9 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ලොට්

30 ද, දකුණට : ලොට් 10 ද, බස්නාහිරට : අංක 1407 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 23715 දරන පිඹුර අනුව පර්චස් දොළහක් (අ.0, රූ.0, පර්.12) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 830/02 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 23715 සහ 2015.10.26 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 29, 30 සහ 24 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබලි මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ අනෙකුත් පරවශතා අයිතිවාසිකම් ද සමග ය.

### තෙවන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර, මාතර ප්‍රාදේශීය සභා සීමාව තුළ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැවඉහළගොඩ ග්‍රාම නිලධාරී වසමේ, වැවඉහළගොඩ පිහිටි බෝගහහේන *හෙවත්* බෝගහහේනේවත්ත නමැති ඉඩමේ ඒකාබද්ධ කළ ලොට් A සහ B දරන ඉඩම් කැබලිවලට බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 23715 සහ 2015.10.26 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 11 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 8 ද, නැගෙනහිරටඃ ලොට් 22 ද, දකුණට : ලොට් 30 ද, බස්නාහිරට : ලොට් 30 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 23715 දරන පිඹුර අනුව පර්චස් දොළහක් (අ.0, රූ.0, පර්.12) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමගවන අතර, මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 830/03 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු රෝහණ උයන්ගොඩ විසින් මැන සාදන ලද අංක 23715 සහ 2015.10.26 දරන පිඹුරේ නිරූපිත ලොට් 29, 30 සහ 24 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබලි මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ අනෙකුත් පරවශතා අයිතිවාසිකම් ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

11 - 307

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මිනුවන්ගොඩ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුවන්ගේ නම් : මාදම්පගේ දිලංග ලකී ගුණරත්න සහ යක්දෙහිගේ පද්මිණී සිල්වා

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2022.06.28 වැනි දින විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව වර්ෂ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, මාදම්පගේ දිලංග ලකී ගුණරත්න බන්ධනදායී වශයෙන් ද සහ යක්දෙහිගේ පද්මිණී සිල්වා බන්ධනදායි සහ උකස්කරු වශයෙන් ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.04.27 දිනැති අංක 323 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2021.04.12 දිනැති අංක 861 දරන ද්විතීක උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එනම් අංක 323 සහ 861 දරන උකස් බැඳුම්කරයන් මත සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක්,

1. වර්ෂ 2022.04.21 දින වන විට රුපියල් හත් මිලියන පන් ලක්ෂ අසූ හය දහස් හයසිය තිස් පහයි ශත හැත්තෑ හතර (රු. 7,586,635.74)ක මුදලක් සමග රු. 6,856,988.05ක මුදල මත වර්ෂ 2022.04.22 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන්වන තුරු වර්ෂයකට 16% බැගින් පොළිය ද, සහ

2. වර්ෂ 2022.04.21 දින වන විට රුපියල් හය ලක්ෂ හතළිස් හය දහස් තුන්සිය අනූ නවයයි ශත අසූ එක (රු. 646,399.81)ක මුදලක් සමග රු. 646,399.81ක මුදල මත වර්ෂ 2022.04.22 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු වර්ෂයකට 2% බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 323 සහ 861 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු එකී රුපියල් අට මිලියන දෙලක්ෂ තිස් තුන් දහස් තිස් පහයි ශත පනස් පහ (රු. 8,233,035.55)ක මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි

ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ මාදම්පගේ දිලංග ලකී ගුණරත්න සහ යක්දෙහිගේ පද්මිණි සිල්වා යන අය බන්ධනදායීන් සහ උකස්කරුවන් වශයෙන් බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර පී. කේ. සේනාපති වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ ආඬිඅම්බලම උපකාර්යාලයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 154 දැවමොට්ටාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දැවමොට්ටාව ග්‍රාමයේ, වරිපනම් අංක 38 සහ 40 ගම මැද පාර පිහිටා ඇති "නෙල්ලිගහවත්ත සහ දවටගහවත්ත දකුණු කොටස" යනුවෙන් හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 2014.10.19 දිනැති අංක 6240 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1994.01.10 දිනැති අංක 341 දරන පිඹුරේ ලොට් 01 දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරින් : පාර (ප්‍රාදේශීය සභා) ද, නැගෙනහිරින් : පළල අඩි 10ක පාර ද, දකුණින් : ඩී. නෙල්සන් තිලකරත්නට අයිති ඉඩම ද සහ බස්නාහිරට : එම්. සිරියාවතීට අයිති ඉඩම ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයයි බිංදුව (අක්.0, රූ.0, පර්.20.60)ක් විශාලත්වය ඇති ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දෙය වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණපරිදි.

දේවිකා හල්වතුර,
කළමණාකාරිනී - ණය අයකර ගැනීම්.

11 - 286

---

### මහජන බැංකුව - රත්නපුර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

මදූෂ පත්මකුමාර ගමගේ
ගල්කොරටුවගේ ප්‍රේමදාස *නොහොත්* ගල්කොරටුවගේ ප්‍රේමදාස ගමගේ

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29 D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022.10.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් දර්ශනී දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2021.08.13 දිනැති අංක 3819 සහ 2016.01.20 දිනැති අංක 2317 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් කිරීම මදූෂ පත්මකුමාර ගමගේ, ගල්කොරටුවගේ ප්‍රේමදාස *නොහොත්* ගල්කොරටුවගේ ප්‍රේමදාස ගමගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 3819 උකස්කරය යටතේ රුපියල් තුන්කෝටි අසූ තුන්ලක්ෂ අසූ දහසක (රු. 3,83,80,000.00) මුදලක් සහ 2022.09.06 දිනට ලැබිය යුතු රුපියල් විසිහත්ලක්ෂ එක්දහස් අටසිය විසි එකයි ශත විසි එකක (රු. 2,701,821.21) පොළිය ද සමග මුළු මුදල වන රුපියල් හාර කෝටි දසලක්ෂ අසූ එක්දහස් අටසිය විසි එකයි ශත විසි එකක (රු. 4,10,81,821.21) මුළු මුදල එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක්, 2022.09.07 දින සිට රුපියල් තුන්කෝටි අසූතුන්ලක්ෂ අසූ දහසක (රු. 3,83,80,000.00)ක මුල් මුදලට AWPLR+ 5.5% බැගින් වැඩිදුර පොළිය ද, සහ

එකී අංක 2317 උකස්කරය යටතේ රුපියල් තිස් අටලක්ෂ අසූ අටදහස් අටසිය අසූ නමයයි ශත හයක (රු. 3,888,889.06) මුදලක් සහ 2022.09.06 දින දක්වා ලැබිය යුතු රුපියල් දෙලක්ෂ දෙදහස් එකසිය හතළිස් නමයයි ශත හැට දෙකක (රු. 202,149.62) පොළිය ද සමග රුපියල් හතළිස් ලක්ෂ අනූ එක්දහස් තිස් අටයි ශත හැට අටක (රු. 4,091,038.68) මුළු මුදල ද එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් 2022.09.07 දින සිට තිස් අටලක්ෂ අසූ අටදහස් අටසිය අසූ නමයයි ශත හයක (රු. 3,888,889.06) මුල් මුදලට AWPLR+ 4.5% බැගින් වැඩිදුර පොළිය ද,

වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ "29 එල්" (29 L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්කෝටි අසූ තුන්ලක්ෂ අසූ දහසක (රු. 3,83,80,000.00) මුදල සහ පොළිය, රුපියල් තිස් අටලක්ෂ අසූ අටදහස් අටසිය අසූ නමයයි ශත හයක (රු. 3,888,889.06) මුදල සහ පොළිය අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර කුරුවිටගේ ප්‍රේමලාල් නවනන්දන සිල්වා විසින් එකී අංක 3819 සහ 2317 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, දකුණු උඩ පත්තුවේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නපුර නගර සභා බල ප්‍රදේශය තුළ 152 ඩී මිහිඳුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොස්පැලවින්න ගමේ පිහිටි "ගේට් ෆීල්ඩ්" නැමති අවසරලත් මානක එච්. පී. එස්.

රාජපක්ෂ මහතා විසින් 2015.08.28 දින මැන සම්පාදිත 5962 දරන පිඹුරේ කැබලි අංක A ලෙස සඳහන්,

උතුරට : පිඹුරු අංක $106^G$ හි කැබලි අංක 22 ද, නැගෙනහිරට : පිඹුරු අංක $106^G$ හි කැබලි අංක 24 සහ 27 ද, දකුණට: පිඹුරු අංක $106^G$ හි කැබලි අංක 29 ද, බස්නාහිරට : පිඹුරු අංක $106^G$ හි කැබලි අංක 97 (පාර) ද,

යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුනයි දශම දෙකයි බිංදුවක් (අක්.00, රූඩ්.01, පර්.3.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි නිවාස, ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලුම දේද වේ. (මෙම ඉඩම එම්. එස්. ටී. පී. සේනාධීර මානක තැන විසින් 1964.07.02 දින මැන සම්පාදිත අංක $106^G$ දරන පිඹුරේ කැබලි අංක 25 සහ 26 ඒකාබද්ධ කර සකස්කර ඇත.)

මෙය දැනට රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 167/102 දරන පත්ඉරුව යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ප්‍රාදේශීය කළමනාකරු,
රත්නපුර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය, රත්නපුර.

11 - 279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.